**හින්දු සංස්කෘතික අරමුදල - 2016**

---------------------------------------------

හින්දු සංස්කෘතික අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, ලැබීම් හා ගෙවීම් ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හින්දු සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව, අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රජයේ ප්‍රදාන සහ අරමුදලට කරන ලද පරිත්‍යාග ගිණුම් තැබීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.3** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1(ඇ) ඡේදය අනුව අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාළ මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතු වුවද, 2016 වර්ෂය තුළදී කෝවිල් සඳහා මූල්‍ය ආධාර ලබාදීම, හින්දු අරනෙරි පාසල් ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් මිලදී ගැනීම, හින්දු ආගමික උත්සව වියදම් සහ දහම් පොත් මිලදී ගැනීම වැනි කටයුතු සඳහා අනුමත අයවැය ලේඛනයකින් තොරව රු.5,166,716 ක වියදම් දරා තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,428,489 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.786,656 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.641,833 ක වර්ධනයක් විය. ආයෝජන පොලී ආදායම රු.334,545 කින් වැඩිවීම සහ පඩුරු මුදල් එකතු කිරීමේ ව්‍යාපෘතියේ ශුද්ධ ආදායම ලෙස රු.709,019 ක් ලැබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

හින්දු සංස්කෘතික අරමුදල් පනතේ 5වන වගන්තිය අනුව අරමුදලේ ප්‍රධාන අරමුණු හා පරමාර්ථ ලෙස හින්දු පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම, හින්දු ආගම හා සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම සහ හින්දු ආගම සම්බන්ධ පර්යේෂණ කටයුතු, ප්‍රකාශන එළිදැක්වීම හා පරිවර්තන කටයුතු සඳහා මූල්‍ය සහ අනෙකුත් සහායයන් ලබාදීම දක්වා තිබුණද එකී අරමුණු හා පරමාර්ථ ඉටුකිරීම සඳහා අරමුදල විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග සැලසුම් කර ඉටුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

හින්දු සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව හින්දු ආගමික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා හින්දු අරනෙරි පාසැල් සංවර්ධනය යන ප්‍රධාන වැඩසටහන් 2ක් යටතේ කාර්යයන් 12 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

(අ) හින්දු ජනතාව සඳහා ආගමික පොත්ද, අරනෙරි පාසැල් ළමුන් සඳහා අභ්‍යාස පොත් හා උපකාරක පොත්ද මිලදී ගෙන බෙදාහැරීමට සැලසුම් කර සමාලෝචිත වර්ෂය තුලදී පොත් මිලදී ගැනීම සඳහා රු.1,408,550 ක් වැයකර තිබුණද එම පොත් තොගයෙන්, වටිනාකම රු.772,417 ක පොත් බෙදාහැර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබූ පඩුරු මුදල් එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) අරනෙරි පාසැල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් බෙදාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,268,840 ක් වැය කර සාරි 1200 ක් මිලදී ගෙන තිබුණද 2017 වර්ෂයේ මැයි මාසය වනවිටත් සාරි 1148 ක් බෙදාහැර නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) තොග පාලනය | අරමුදල මගින් මිලදී ගන්නා භාණ්ඩ ලේඛනගත කිරීම හා එම භාණ්ඩ බෙදා හැරීමේදී ප්‍රතිලාභීන් පිළිබඳ වාර්තා තබා නොගැනීම. |
| (ආ) සැලසුම්කරණය | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අපේක්ෂිත සියලු ආදායම් හා ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබීම හා අවශ්‍ය සංශෝධනයන් නොකිරීම. |